# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## 2016

**මහා භාණ්ඩාගාරය**

**කොළඹ - 01**


දුරකථන : 011 - 2484757

ෆැක්ස් : 011 - 2430270

ඊ-මේල් : dgms@msd.treasury.gov.lk

# දැක්ම

**රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම**

# මෙහෙවර

**රාජ්‍ය සේවය විශිෂ්ට මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රශස්ත තනතුරු ප්‍රමාණ රාජ්‍ය ආයතන වෙත ලබාදීම**

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් රාජ්‍ය අංශයේ සමස්ත මානව සම්පත ප්‍රශස්ථ ආකාරයෙන් කළමනාකරණය කිරීමේ සුවිශේෂී වගකීම පෙරදැරි කර ගෙන 2016 වර්ෂයේ දී මෙරට රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සුවිශේෂී ඉදිරි පියවර රැසක් තැබීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. ඒ තුළින්, ක්‍රමිකව ගොඩ නැගෙන රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වය වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වයක් ලබා දීමට හැකි වීම අතිශයෙන් වැදගත්වේ.

පසුගිය වර්ෂයේදී රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීමෙහි ලා කේන්ද්‍රීය තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමෙහි සුවිශේෂී කාර්ය වෙනුවන් මුල් පියවර තැබීමට හැකි වීම සහ රාජ්‍ය අංශයේ සමස්ත ආයතනික යාන්ත්‍රණය කේන්ද්‍ර කොට ගනිමින් කාර්ය මණ්ඩල සමාලෝචනය පිළිබඳ ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීමට හැකිවීම ද වඩාත් වැදගත් වේ.

මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙවර මැනවින් ඉටුකිරීම උදෙසා නිසි මග පෙන්වීම් හා සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මැතිතුමාට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ට සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මාගේ හද පිරි ප්‍රණාමය පුද කරමි. තවද රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේ දී අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණය ගැනීම උදෙසා සහයෝගයෙන් සහ සහජීවනයෙන් නිරන්තරයෙන්ම කටයුතු කළ රාජ්‍ය අංශයේ සියලු ආයතනයන්ට ද, දැඩි කැපවීමෙන් හා කණ්ඩායම් හැගීමෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සාධනීය ලෙස ඉටුකිරීමට දායකත්වය ලබා දුන් මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද ප්‍රශංසාව පිරි නමමි.

මෙතෙක් ආ ගමන් මග තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන සමස්ත රාජ්‍ය සේවය විශිෂ්ටත්වය කරා ගෙන ඒම උදෙසා සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට පත් වීමට සියළු දෙනාගේම සහයෝගය සහ කැපවීම අපේක්ෂා කරමි.

**එච්.ජී. සුමනසිංහ**

**අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 - 2 |
| 2. | කාර්ය මණ්ඩල කළමනාකරණය | 3 - 8 |
| 3. | වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය | 9 - 10 |
| 4. | පර්යේෂණ, නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා කමිටු නියෝජනය | 11 - 12 |
| 5. | ආයතන අංශය | 13 - 19 |
| 6. | මූල්‍ය අංශය | 20 - 21 |
| 7. | උපලේඛනය | 22 |

# 1. හැඳින්වීම

## 1.1 පසුබිම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ 1999 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරනු ලැබිය. එතැන් සිට ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමින් රාජ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ආයතනික මට්ටමින් අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය හඳුනා ගැනීමත්, එසේ හඳුනා ගන්නා තනතුරුවලට අදාළ වැටුප් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් /උසස් කිරීම් පරිපාටි සඳහා අනුමැතිය ලබාදීම ආදී කටයුතු මගින් රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සපයා ඇත. මෙහිදී රටේ මූල්‍ය තත්ත්වය, සංවර්ධන විභවතාවය, කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ඇති කිරීම වැනි අංශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය විය. මේ සඳහා කාලීන අවශ්‍යතා පරිදි අදාළ  අනෙකුත් ආයතන සමඟ ද මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කාර්යමණ්ඩල සමාලෝචන තුළින් රාජ්‍ය අංශයට අවශ්‍ය ප්‍රශස්ත මානව සම්පත පවත්වා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත.

## 1.2 පරමාර්ථ

රාජ්‍ය අංශයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා මූලික පරමාර්ථ කිහිපයක් යටතේ මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

i. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය
ii. ජාතික වැටුප් ප්‍රතිපත්තීන්ට අනුකූලව වැටුප් හා දීමනා තීරණය කිරීම
iii. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳව අධ්‍යයන සිදු කිරීම

## 1.3 කාර්යභාරය

(i) රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල සංශෝධන හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම

(ii) රාජ්‍ය අංශයේ ආයතනවල මෙහෙවර සහ අරමුණු අනුව උපරිම කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හඳුනා ගැනීම මගින් පද්ධති සහ ක්‍රමවේද හඳුන්වාදීම උදෙසා කාර්ය මණ්ඩල සමාලෝචන

(iii) රාජ්‍ය අංශයේ ආයතනවල යටපත් කළ යුතු තනතුරු සහ තනතුරු ප්‍රතිශෝධනයන් හඳුනා ගනිමින් තනතුරු ඇති කිරීම සහ පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම

(iv) කාර්ය මණ්ඩල අනුමැතිය ලබා දීම සහ රජයේ ව්‍යාපෘති සඳහා වැටුප් නිර්ණය කිරීම

(v) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජයට අයිති සමාගම්වල බඳවා ගැනීමේ පටිපාටි සහ උසස් කිරීමේ පටිපාටි සඳහා අනුමැතිය ලබා දීම

(vi) කාර්ය මණ්ඩල අවශ්‍යතාවන්  සලකා නිර්ණායකයන් සහ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම/ රාජ්‍ය අංශයේ තනතුරු සඳහා නිර්ණායකයන් සහ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම

(vii) අතිරික්ත කාර්ය මණ්ඩල හඳුනා ගැනීම, ඔවුන් ඵලදායි ලෙස යෙදවීම සහ සේවාවන් සංශෝධනය හා අත්හිටුවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

(viii) භෞතික පරිසර ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සහ යාන්ත්‍රිකරණය/ ස්වයංක්‍රීය කළ යුතු, පරිගණක ගත කළ යුතු සහ බාහිරින් ලබාගත යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම

(ix) සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසිවල සංවර්ධන අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරමින් අධ්‍යනය කිරීම / සමාලෝචනය කිරීම

(x) රාජ්‍ය අංශයට විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයෙහි නිරත කරවීම සහ උපදේශකවරුන් පත් කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල යෝජනා මනාව අධ්‍යයනය කිරීමෙන් පසු ඒ පිළිබඳව පරීක්ෂා කිරීම සහ අදාල නිර්දේශ ලබා දීම

(xi) රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු පද්ධති නඩත්තු කිරීම

(xii) බඳවා ගැනීම් ප්‍රතිපත්ති, නිපුණතා සංවර්ධන පුහුණු සහ සැලසුම් අනුපිළිවෙල මෙන්ම එවැනි කරුණු ක්‍රියාත්මක කිරීම උදෙසා අදාළ බලධාරීන් වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම

(xiii) රාජ්‍ය අංශයේ වැටුප්, දිරි දීමනා යෝජනා ක්‍රම, සුහසාධන යෝජනා ක්‍රම සහ එවැනි අනෙකුත් පාරිශ්‍රමික යෝජනාවල කළමනාකරණය සහ රාජ්‍ය අංශයේ විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ පිළිබඳ යෝජනාක්‍රම පිළිබඳ අධ්‍යයන කිරීම සහ නිරීක්ෂණ ලබාදීම

(xiv) රාජ්‍ය ආයතනයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රමාණකරණය කිරීමේ අරමුණු ඇතිව රාජ්‍ය අංශයේ ආයතනවල කාර්යයන් ද්විත්වකරණය වීම හඳුනාගැනීම.

(xv) පළාත් සභා සහ පළාත් රාජ්‍ය ආයතනවල ආයතනික සමාලෝචන, කාර්ය මණ්ඩල කළමනාකරණය, වැටුප් පිළිබඳ උපදේශන සේවාවන් ලබාදීම

# 2. කාර්ය මණ්ඩල කළමනාකරණය

## 2.1 හැඳින්වීම

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේ දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- තනතුරු අනුමත කිරීම
- පුරප්පාඩු පිරවීම අනුමත කිරීම
- තනතුරු යටපත් කිරීම
- තනතුරු නාම සංශෝධනය කිරීම
- රාජ්‍ය ව්‍යාපෘතීන් සඳහා කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් තීරණය කිරීම
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි අනුමත කිරීම

රාජ්‍ය අංශය වෙත පැවරී ඇති කාර්ය භාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගත යුතුවේ. ඒ අනුව රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් හා රජයේ ව්‍යාපෘතීන්හි කාලීන මානව සම්පත් අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගෙන ආයතන තුළ ප්‍රශස්ත තනතුරු සංඛ්‍යාවක් පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2016 වර්ෂය තුළ ද සිය කාර්යභාරය මැනවින් ඉටු කරන ලදී.

## 2.2 පරිපාලන මට්ටම අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

රාජ්‍ය අංශයේ සමස්ත සේවා නියුක්තිය 2016.12.31 දිනට 1,353,318 ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, ආරක්ෂක අංශ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ සමස්ත කාර්ය මණ්ඩල සංයුතිය පහත 2.1 වගුව මඟින් දැක්වේ.

**වගුව - 2.1 රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2016**

| පරිපාලන මට්ටම | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික | 865,788 | 754,590 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 412,796 | 372,033 |
| **සමස්ත රාජ්‍ය සේවය** | **1,278,584** | **1,126,623** |
| රාජ්‍ය ව්‍යවසායන් හා රාජ්‍ය බැංකු | 240,029 | 226,695 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,518,613** | **1,353,318** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.3 රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය - 2016

මහජනතාව වෙත කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළත් රාජ්‍ය අංශය සඳහා 2016 වසර තුළ දී ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

### 2.3.1 තනතුරු ඇති කිරීම - 2016

තනතුරු අනුමත කිරීමේ දී අදාල ආයතනවලට පැවරී ඇති කාර්යභාරය, රටේ මූල්‍ය ශක්‍යතාවය මෙන්ම තනතුරු ඇති කිරීමේ කාලීන අවශ්‍යතාවය ද සැලකිල්ලට ගන්නා ලදී. රාජ්‍ය අංශය සඳහා තනතුරු ඇති කිරීම පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් මට්ටමින් කරන ලද , 2013 - 2016 අතර සංසන්දනාත්මක වර්ගීකරණය පහත 2.2 වගුව මගින් දක්වා ඇත.

**වගුව - 2.2 තනතුරු ඇති කිරීම (2013 - 2016)**

| ආයතනය | 2013 | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|
| | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | 15,315 | 77 | 5,326 | 50 | 11,179 | 70 | 7,108 | 28 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 3,093 | 16 | 3,926 | 37 | 3,131 | 20 | 17,984 | 72 |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | 1,330 | 7 | 1,422 | 13 | 1,557 | 10 | 00 | 00 |
| **එකතුව** | **19,738** | **100** | **10,674** | **100** | **15,867** | **100** | **25,092** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ඒ අනුව 2016 වර්ෂයේ දී අනුමත තනතුරු අතරින් සියයට විසි අටක් **(28%)** අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වේ.

පසුගිය දශකය තුළ සමස්ත රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 2.3 වගුවෙන් දැක්වේ.

වගුව - 2.3 රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය 2007 -2016

| පරිපාලන මට්ටම | | වර්ෂය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| ජාතික | අනුමත | 579,615 | 635,711 | 680,442 | 698,335 | 705,331 | 710,909 | 796,266 | 844,948 | 858,680 | 865,788 |
| | සත්‍ය | 505,900 | 557,590 | 607,717 | 643,748 | 643,399 | 661,837 | 683,719 | 703,600 | 722,950 | 754,590 |
| පළාත් සභා සහ පළාත් පාලන ආයතන | අනුමත | 358,604 | 362,755 | 364,396 | 367,207 | 367,730 | 385,562 | 391,647 | 392,698 | 394,812 | 412,796 |
| | සත්‍ය | 283,885 | 290,162 | 296,714 | 332,107 | 363,248 | 378,933 | 375,752 | 377,445 | 374,330 | 372,033 |
| **සමස්ත රාජ්‍ය සේවය** | අනුමත | **938,219** | **998,466** | **1,044,838** | **1,065,542** | **1,073,061** | **1,096,471** | **1,187,913** | **1,237,646** | **1,253,492** | **1,278,584** |
| | සත්‍ය | **789,785** | **847,752** | **904,431** | **975,855** | **1,006,647** | **1,040,770** | **1,059,471** | **1,081,045** | **1,097,280** | **1,126,623** |
| රාජ්‍ය ව්‍යවසාය සහ බැංකු | අනුමත | 222,377 | 226,197 | 227,224 | 227,792 | 228,326 | 245,100 | 245,687 | 245,339 | 244,800 | 240,029 |
| | සත්‍ය | 224,443 | 229,445 | 234,547 | 236,121 | 236,543 | 239,079 | 239,058 | 221,213 | 219,583 | 226,695 |
| **සමස්ත රාජ්‍ය අංශය** | අනුමත | **1,160,596** | **1,224,663** | **1,272,062** | **1,293,334** | **1,301,387** | **1,341,571** | **1,433,600** | **1,482,985** | **1,498,292** | **1,518,613** |
| | සත්‍ය | **1,014,228** | **1,077,197** | **1,138,978** | **1,211,976** | **1,243,190** | **1,279,849** | **1,298,529** | **1,302,258** | **1,316,863** | **1,353,318** |
| අනුමත සේවක සංඛ්‍යාවේ උපයෝජනය(%) | | 87 | 88 | 90 | 94 | 96 | 95 | 91 | 88 | 88 | 89 |
| විශ්‍රාම ගිය සංඛ්‍යාව | | 438,190 | 445,120 | 456,113 | 473,762 | 493,549 | 510,343 | 521,699 | 546,379 | 564,472 | 579,414 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ඒ අනුව රාජ්‍ය අංශයෙහි පුළුල් වන සේවා අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් 2007 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දි රාජ්‍ය අංශයෙහි අනුමත සේවක සංඛ්‍යාව 30% කින් ඉහළ නැංවී ඇත. කෙසේ වුව ද, බඳවා ගැනීම් සහ විශ්‍රාම ගැනීම් අතර පරතරය වැඩි වීම හේතුවෙන් 2016 වර්ෂයෙහි අනුමත කාර්යය මණ්ඩලයෙන් සත්‍ය වශයෙන් උපයෝජනය කර ඇත්තේ සියයට අසූ නවයක් (89%) පමණි. 2.3 වගුව අනුව 2007 සිට 2016 වර්ෂය දක්වා දස වසර තුළ අනුමත කාර්ය මණ්ඩලයේ වැඩිම උපයෝජනය දක්වා ඇත්තේ 2011 වර්ෂයේදී ය.

1946 වර්ෂයේ සිට මේ දක්වා ජනගහන වර්ධනයට සාපේක්ෂව රාජ්‍ය සේවක සංඛ්‍යාව වර්ධනය පිළිබඳ තොරතුරු වගුව 2.4 අනුව සසඳා බැලීමේ දීරාජ්‍ය සේවක සංඛ්‍යාව 2001 වසර දක්වා ක්‍රමික හා අනුපාතික වර්ධනයක් පෙන්නුම් කළ ද 2000/2001 වසරවල සිට ඉහළ වර්ධන අගයකින් රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වේ. මෙයට හේතුව වශයෙන් රාජ්‍ය සේවයට උපාධිධාරීන් වරින්වර විශාල කණ්ඩායම් වශයෙන් ඇතුළත් කර ගැනීම හේතු වී ඇතැයි නිගමනය කළ හැක.

වගුව - 2.4 ශ්‍රී ලංකාවේ ජනගහනය හා රාජ්‍ය සේවක සංඛ්‍යාව

| වර්ෂය | සමස්ත ජනගහනය | රාජ්‍ය සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | රාජ්‍ය සේවයේ සේවක සංඛ්‍යාව | අර්ධ රාජ්‍ය සේවයේ සේවක සංඛ්‍යාව | සමස්ත රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව |
| 1946 | 6,657,339 | 60,901 | - | 60,901 |
| 1953 | 8,097,895 | 222,845 | - | 222,845 |
| 1963 | 10,582,064 | 365,292 | - | 365,292 |
| 1971 | 12,689,897 | 323,718 | 145,810 | 469,528 |
| 1981 | 14,846,750 | 368,849 | 228,531 | 597,380 |
| 2001 | 18,732,400 | 587,805 | 247,845 | 835,650 |
| 2012 | 20,359,439 | 1,122,734 | 244,989 | 1,367,723 |
| 2016 | - | *874,395 | *243,413 | *1,117,808 |

*ත්‍රිවිධ හමුදාවල කාර්යය මණ්ඩලය හැර

මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

## 2.3.2 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම හා තනතුරු යටපත් කිරීම

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයේ සහ පළාත් පාලන ආයතන ඇතුළුව පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල ඇතිවන පුරප්පාඩු පිරවීම අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය මත සිදු කළ අතර, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ඇතිවන පුරප්පාඩු පිරවීම සේවයේ අවශ්‍යතාවය සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.

## 2.3.3 ව්‍යාපෘති කාර්ය මණ්ඩල සහ වැටුප් කළමනාකරණය

ජාතික හා පළාත් මට්ටමින් රට තුළ ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති, සැලසුම්ගත කාල වකවානු තුළ නිම කිරීමට අවශ්‍ය වන කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබා දීම හා එම තනතුරුවලට අදාල වැටුප් තීරණය කිරීම 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි විධිවිධාන අනුව 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිදු කරනු ලැබිණි. සංවර්ධන ප්‍රමුඛතාවයන් මත ඉලක්කගත ආර්ථික සංවර්ධන කටයුතු පහසු කිරීම උදෙසා දැනුමින් හා අත්දැකීම් සපිරි වෘත්තිකයින්ගේ ඵලදායි සේවයක් ලබා ගැනීම වෙනුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩල තනතුරු හා වැටුප් සංශෝධනය කර 2016.03.24 දිනැතිව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 නිකුත් කරන ලදි. ඒ අනුව 2016 වසර තුළදී ද මෙම කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉහළ සහයෝගයක් ලබා දෙන ලදී.

වගුව - 2.5 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම - 2016

| අනු අංකය | ව්‍යාපෘතිය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 174 |
| 2. | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය | 60 |
| 3. | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 - අදියර II | 37 |
| 4. | බදුල්ල - චෙන්කලඩි මාර්ග ව්‍යාපෘතිය | 13 |
| 5. | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන | 20 |
| 6. | මොරගහ කන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 111 |
| 7. | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය | 05 |
| 8. | වෙරළ ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | 84 |
| 9. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 01 |
| 10. | ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාසවලට ජනයා අනුගත කිරීමේ ව්‍යාපාතිය | 06 |
| 11. | මානව පෝෂණය හා යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවාහගත කිරීමේ ව්‍යාපෘතිය | 09 |
| 12. | පරිසර සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය හා පරිසර පද්ධති සේවා පෝෂණය වැඩි කිරීමේ ව්‍යාපෘතිය | 09 |
| 13. | ජාතික ඕසෝන් ඒකකය | 03 |
| 14. | ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය | 01 |
| 15. | ලෝක බැංකු ආධාර යටතේ වූ පරිසර පද්ධතිය සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය | 26 |
| 16. | ශ්‍රී ලංකාව තුළ පරිසරයට අහිතකර ද්‍රව්‍ය හා රසායනික කළමනාකරණය කිරීමේ වැඩසටහන | 10 |
| 17. | කාලගුණික විපර්යාස සහ අත්‍යන්ත සිදුවීම් තුළින් වියලි කලාපයේ කුඩා පරිමාණ ගොවීන් ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය | 28 |
| 18. | බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය | 18 |
| 19. | පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය | 19 |
| 20. | හැඩ ඔය ජලාශ සහ කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය | 18 |
| 21. | මහවැලි වැව් ඉවුරේ පහල ද්‍රෝණිය සංවර්ධන ව්‍යාපෘතිය | 15 |
| 22. | ගිං - නිල්වලා ගඟ හැරවුම් ව්‍යාපෘතිය | 14 |
| 23. | මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය | 18 |
| 24. | පොළොන්නරුව දිස්ත්‍රික් වාරිමාර්ග පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය සහ මොනරාගල දිස්ත්‍රික් කඩිනම් වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 45 |
| 25. | දේශගුණික ප්‍රත්‍යස්ථාතිය වැඩි දියුණු කාරීමේ ව්‍යාපෘතිය | 490 |
| 26. | මුල්‍ය නගර ව්‍යාපෘතිය | 04 |
| 27. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් දිරිගැන්වීමේ ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය | 11 |
| 28. | RAMIS | 19 |
| 29. | සමාජ ආරක්‍ෂණ ජාල ව්‍යාපෘතිය | 19 |
| 30. | කාර්යක්‍ෂමතා කළමනාකරණය ව්‍යාපෘතිය | 14 |
| 31. | කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 01 |
| 32. | උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 73 |
| 33. | ඒකාබද්ධ සමාජ සංවර්ධන ව්‍යාපෘතිය | 131 |
| 34. | ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය | 101 |
| 35. | පරිපාලන නගර ව්‍යාපෘතිය | 219 |
| 36. | ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 78 |
| 37. | වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 110 |
| 38. | කුරුණෑගල - දඹුල්ල හරහා හබරණ දක්වා නව දුම්රිය මාර්ගය ඉදිකිරීම | 28 |
| 39. | මාතර - බෙලිඅත්ත - කතරගම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | 04 |

| | | |
|---|---|---|
| 40. | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය | 33 |
| 41. | කොළඹ නගරාශ්‍රිත දුම්රිය මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය | 26 |
| 42. | ශ්‍රී ලංකාවේ ගැටුම් පැවැති ප්‍රදේශයන්හි ඉදිරි පෙළ නිලධාරින් ප්‍රජා සංවර්ධනය පිළිබඳ පුහුණු කිරීමේ ව්‍යාපෘතිය | 21 |
| 43. | මහා බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය - අදියර II ස්පාන්ඩෙක්ස් ගුවන් පාලම් ව්‍යාපෘතිය | 37 |
| 44. | බස්නාහිර පළාත් මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 15 |
| 45. | කැළණි ගඟ හරහා වූ නව පාලම ගොඩනැගීමේ ව්‍යාපෘතිය | 26 |
| 46. | සෞඛ්‍ය සේවා විද්‍යා පීඨය සංවර්ධනය - නැගෙනහිර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාව | 15 |
| 47. | වාරය පිවිසුම් උස් කරන ලද මාර්ග ව්‍යාපෘතිය | 21 |
| 48. | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 43 |
| 49. | නව කැළණි පාලමේ සිට රාජගිරිය මාර්ගයේ ව්‍යාපෘතිය | 16 |
| 50. | පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය | 01 |
| 51. | පැලියගොඩ - පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම තැනීම | 12 |
| 52. | දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 35 |
| 53. | කුඩා තේ වතු හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය | 50 |
| 54. | කෘෂිකාර්මික අංශයේ නවීකරණ ව්‍යාපෘතිය | 30 |
| 55. | ජාතික කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන (NADP) | 16 |
| 56. | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADep) | 03 |
| 57. | පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය කළමනාකරණ ඒකකය | 77 |
| 58. | නිපුණතා අංශික සංවර්ධන අංශය | 03 |
| 59. | නිපුණතා අංශික සංවර්ධන වැඩසටහන | 02 |
| 60. | දීර්ඝ කාලීනව අභ්‍යන්තර අවතැන් වූවන් උතුරු පළාතේ නැවත පදිංචි කිරීම සඳහා අවතැන් වූවන් සංගණනය කිරීමේ කාරය බලකාය | 25 |
| 61. | පොල්ගහවෙල, පොතුහැර, අලව්ව, ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය | 33 |
| 62. | අළුත්ගම, මතුගම, අගලවත්ත, ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 41 |
| 63. | කුණ්ඩසාලේ, හරත්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 39 |
| 64. | මහනුවර උතුරු, පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 54 |
| 65. | විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය | 63 |
| 66. | ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය | 26 |
| 67. | මහරගම - බොරලැස්ගමුව / හලාවත - පුත්තලම ජල අපහරණ ව්‍යාපෘතිය | 27 |
| 68. | සනීපාරක්ෂාව හා එම කටයුතු හඳුන්වාදීම පිළිබඳ ව්‍යාපෘතිය | 13 |
| 69. | රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 23 |
| 70. | ජලසම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 82 |
| 71. | කැලණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය | 38 |
| 72. | අනුරාධපුර - උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය | 55 |
| 73. | නිධන්ගත වකුගඩු රෝග නිවාරණ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා වන උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | 13 |
| 74. | අඹතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය | 33 |
| 75. | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | 18 |
| 76. | මැදි ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධන කඩිනම් ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය | 13 |
| 77. | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 19 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරය අතර රාජ්‍ය අංශයේ වැටුප් හා ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම හා වෙනත් පාරිශ්‍රමික කළමනාකරණය ද ප්‍රමුඛ වේ. මෙම කාර්යයේ දී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව යන ආයතනවල නිරීක්ෂණ සහ නිර්දේශ ද සැලකිල්ලට ගෙන අදාළ තීරණ ලබා දීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. එසේම වැටුප් හා පාරිශ්‍රමික පිළිබඳ ප්‍රායෝගික ගැටලු පැන නඟින අවස්ථාවල දී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය උපදෙස් හා පැහැදිලි කිරීම් ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. තවද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව 2016 වසරේ දී ද රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු මෙන්ම වැටුප් හා දීමනා තීරණය කර ඇත. ඒ අනුව 2016 වසර තුළ දී පහත සඳහන් චක්‍රලේඛ නිකුත් කරන ලදී.

### කළමනාකරණ සේවා චක්‍රලේඛ - 2016

| | | |
|---|---|---|
| 01. | 2016.03.24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 | ව්‍යාපෘති කාර්ය මණ්ඩල සහ වැටුප් කළමනාකරණය |
| 02. | 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 | රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කිරීම - 2016 |
| 03. | 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2016 | ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින්ගේ වැටුප් සංශෝධනය - 2016 |
| 04. | 2016.08.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2016 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ විශ්ව විද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම - 2016 |
| 05. | 2016.08.22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2016 (I) | ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින්ගේ වැටුප් සංශෝධනය - 2016 |
| 06. | 2016.08.30 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2016 | මහාධිකරණ විනිශ්චයකාර සහ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයන් සඳහා වන වැටුප් ව්‍යුහය - 2016 |
| 07. | 2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 (I) | රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කිරීම - 2016 |

| | | |
|---|---|---|
| 08. | 2016.11.07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2016 | පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම - 2016 |
| 09. | 2016.12.16 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 (I) | ව්‍යාපෘති කාර්ය මණ්ඩල සහ වැටුප් කළමනාකරණය |

# 4. පර්යේෂණ, නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා කම්ටු නියෝජනය

## 4.1 පර්යේෂණ කටයුතු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරයන් අතරින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවන්ට අදාළ වූ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳ සම්මත මිනුම් හා ප්‍රමිතීන් ගොඩනගා ගැනීම, වැටුප් හා දීමනා සහ අනෙකුත් පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා තීරණ ලබා දීම, රටෙහි සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසි සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම සහ ඊට අදාල නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි අවස්ථාවල දී දෙපාර්තමේන්තුවට අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට සිදු වේ.

එකී කාර්යයන් ඉහළ ප්‍රමිතියකින් හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ අංශයක් ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඵලදායීව ඉටු කිරීමේ දී අවශ්‍ය වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම, එම තොරතුරු විශ්ලේෂණය කර නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කිරීම පර්යේෂණ අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්ය භාරය වේ. මෙහිදී අවශ්‍ය විමර්ශන/අධ්‍යයන සඳහා පර්යේෂණ අංශයේ නිලධාරීන් අදාළ ආයතන වෙත යොමු කර තොරතුරු රැස් කිරීම ද සිදු කෙරේ.

## 4.2 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

රාජ්‍ය අංශයේ ආයතන කටයුතු, වැටුප් හා දීමනා තීරණය කිරීම ආදී මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරයකි. 2016 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ ඒවා අයත් වන විෂය ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු 4.1 වගුව මගින් දක්වා ඇත.

**වගුව - 4.1 අමාත්‍ය මණ්ඩල සංදේශ නිරීක්ෂණ වර්ගීකරණය - 2016**

| අනු අංකය | ක්ෂේත්‍රය/විෂයය | සංදේශ ගණන |
|---|---|---|
| 1. | පත් කිරීම්/ බඳවා ගැනීම් | 185 |
| 2. | සේවය දීර්ඝ කිරීම් | 61 |
| 3. | තනතුරු ඇති කිරීම් | 35 |
| 4. | පාරිශ්‍රමික | 60 |
| 5. | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි | 52 |
| 6. | විනය කටයුතු | 06 |
| 7. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 34 |
| 8. | අනෙකුත් | 172 |
| **එකතුව** | | **605** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළ නිරීක්ෂණ ලබා දෙන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අතරින් තනතුරු සඳහා පත් කිරීම, සේවය දීර්ඝ කිරීම සහ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට අමතරව නිතිපතා පැවැත්වෙන ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීම් සඳහා ද දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ලබා දෙන ලදී.

වසර 2006 - 2016 දක්වා දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු 4.2 වගුව මගින් දක්වා ඇත.

**වගුව - 4.2 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම**

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 820 | 780 | 750 | 1272 | 1598 | 1019 | 399 | 499 | 449 | 537 | 605 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 4.3 කමිටු නියෝජනය, සම්බන්ධීකරණ කටයුතු හා සන්නිවේදනය

සංවර්ධන හා ආයතන කටයුතු සම්බන්ධ පහත සඳහන් සමුළු හා සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නියෝජනය කරමින් ක්‍රියාකාරී ලෙස දායකත්වය සපයා ඇත.

- ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත්ව පත් කර ඇති නිලධාරි කමිටු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)
- දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමුළු
- පළාත් ප්‍රධාන ලේකම් සමුළු
- ජාතික වැටුප් කොමිෂන් සභා සාකච්ඡා
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන සහ නියාමන (Steering) කමිටු
- ව්‍යවස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම්
- ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු

තවද, විවිධ ආයතනයන්හි ඉල්ලීම් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් වශයෙන්ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වී ඇත. එසේම, රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ගැටලු සම්බන්ධයෙන් අදාල නිලධාරීන් සමග නිරන්තර සාකච්ඡා පවත්වනු ලැබේ. මේ අයුරින්, රාජ්‍ය අංශයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරනු වස් ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරනු ලැබ ඇත.

# 5. ආයතන අංශය

## 5.1 හැඳින්වීම

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රැකියා තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තුවේ භෞතික පරිසරය, රැකියා තෘප්තිය වර්ධනය කරලීමට සමත් මිත්‍රශීලී කාර්යාල පරිසරයක් ලෙස සකස් කර දීමටත්, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී සෙසු කාර්ය මණ්ඩලයට අවශ්‍ය සහයෝගය ලබා දීමටත් ආයතන අංශය කටයුතු කරන ලදී.

2016 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සතුව තිබූ මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිත කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගැනීමට සමත් විය. 2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩල තොරතුරු 5.1 වගුව මගින් දැක්වේ.

**වගුව - 5.1 2016.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු**

| අනු අංකය | තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 3. | අධ්‍යක්ෂ | 8 | 4 | 4 |
| 4. | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 12 | 6 | 6 |
| 5. | ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 6. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 1 | 0 | 1 |
| 7. | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 8. | භාෂා පරිවර්තක | 1 | 1 | 0 |
| 9. | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නිලධාරී | 1 | 1 | 0 |
| 10. | පර්යේෂණ සහකාර | 3 | 3 | 0 |
| 11. | සංවර්ධන නිලධාරී | 6 | 3 | 3 |
| 12. | තොරතුරු තාක්ෂණ සහකාර | 1 | 1 | 0 |
| 13. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 35 | 31 | 4 |
| 14. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 1 | 0 | 1 |
| 15. | ලේඛන සහකාර | 1 | 0 | 1 |
| 16. | රියදුරු | 8 | 8 | 0 |
| 17. | කාර්යාල කාර්ය සහායක | 7 | 7 | 0 |
| | **එකතුව** | **89** | **69** | **20** |

2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්යමණ්ඩලය පහත ලේඛනය - 01 මගින් දක්වා ඇත.

**ලේඛනය - 01 2016.12.31 දිනට කාර්යමණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | එච්.ජී.සුමනසිංහ මයා | අධ්‍යක්ෂ ජනරාල් |
| 2. | බී.එම්.එස්.බණ්ඩාර මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 3. | ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය | අධ්‍යක්ෂ |
| 4. | එස්.එච් ඩී. කළුතන්ත්‍රී මිය | අධ්‍යක්ෂ |
| 5. | එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා | අධ්‍යක්ෂ |
| 6. | බී.එම්.ඩී.එන්.බාලසූරිය මිය | අධ්‍යක්ෂ |
| 7. | පී. චාමිකා මධුවන්ති මිය | සහකාර අධ්‍යක්ෂ |
| 8. | ඩබ්.එච්.ජී.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 9. | එම්.ඩී. අබේගුණවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 10. | ඩබ්.ඩී. සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 11. | එස්.ඒ.එච්. සමරසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 12. | එම්.ඒ.එස්. මධුශංක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 13. | කේ.ඩී.අයි.එස්.කේ. සිරිවර්ධන මිය | ගණකාධිකාරි |
| 14. | පී.කේ. සරත්චන්ද්‍ර මයා | පරිපාලන නිලධාරි |
| 15. | එන්.බී.එන්.පී.ජීවසිරි මිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී |
| 16. | පී. ඩී. ඩී. සමරසේකර මිය | භාෂා පරිවර්තක |
| 17. | එම්.එම්.ඒ.එන්. මල්පෝරු මිය | පර්යේෂණ සහකාර |
| 18. | එස්.එම්.එම්.ඩී. සමරවීර මයා | පර්යේෂණ සහකාර |
| 19. | බී.එම්. සරත් මයා | පර්යේෂණ සහකාර |
| 20. | එච්.එස්.ඒ. හේනෙපොල මිය | සංවර්ධන නිලධාරි |
| 21. | එස්.එස්. ඇල්පිටියගේ මිය | සංවර්ධන නිලධාරි |
| 22. | ඊ.එච්.එන්.ජේ. එදිරිසිංහ මයා | සංවර්ධන නිලධාරි |
| 23. | එම්.පී.එස්. සල්ගාදු මයා | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර |
| 24. | එම්.ඩී.පී.එස්.ආර්. පතිරණ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 25. | ඒ.එම්.එස්.එස්.කේ. අරම්පත් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 26. | කේ.එස්.එස්. ආර්. සෙනෙවිරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 27. | එච්.එල්. මංගලිකා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 28. | කේ. ජී. එන්. දිල්මිණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 29. | කේ.අයි. පෙරේරා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 30. | ඩබ්.එම්. චමින්ද කුසුම් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 31. | එස්.එස්. බියන්විල මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 32. | ටී. ශිරාණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 33. | එස්.පී. සෙල්ලාහැන්නදි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 34. | ඒ.කේ. ඩී. ප්‍රියංකා සෝමසිරි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 35. | ජේ.ඒ. නේෂා දේදුණු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 36. | එච්.බී.සී.එම්. දසනායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 37. | ඩබ්.ජී.ඒ. මේකලා ජීවනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 38. | කේ.ජී.තරංගා ඉරෝෂනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 39. | ජී.එන්.එච්. අබයවර්ධන මෙනෙවිය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 40. | එල්.පී. විතානගේ මයා | රාජ්‍ය කළමණාකරණ සහකාර |

| | | |
|---|---|---|
| 41. | එම්.ඒ.කේ.සී.සමරසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 42. | ආර්. ඒ. පී. එල්. රූපසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 43. | එල්.එච්.ඒ.පී.එම්. දයාරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 44. | ආර්.ඩබ්.ජී. හිරන්ත රාජසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 45. | එම්.එන්.එම්. උසාමා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 46. | ඩබ්.එස්. සඳරුවන් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 47. | ආර්.ඒ. විජේසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 48. | කේ.ඩී.එම්.කේ. දිලේකා කප්පාගොඩ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 49. | ඩබ්. ඒ. සුරේෂ් මංගල මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 50. | එච්.ඩී.එන්.එස්. හෙට්ටිකංකානම මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 51. | එම්. රත්නායක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 52. | එච්. එම්. එස්. චරිතා ජයසිංහ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 53. | යූ.එල්.ඒ. රිශාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 54. | ඩබ්.ටී.ඩී. ද සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 55. | ජී.ඩී.සී.පී. ගුණරත්න මයා | රියදුරු |
| 56. | අයි.පී.ඩබ්.බුද්ධික රත්නසිරි මයා | රියදුරු |
| 57. | ඩී. උපාලි මයා | රියදුරු |
| 58. | බී.ඒ. සුනිල් ජයරත්න මයා | රියදුරු |
| 59. | ඩබ්.ඩී.අමරසිරි වික්‍රමසිංහ මයා | රියදුරු |
| 60. | ඒ.ජී. රංජිත් කුමාර මයා | රියදුරු |
| 61. | ජේ.ජී. සරත් කුමාර මයා | රියදුරු |
| 62. | බී.ඒ.පී.ප්‍රේමතිලක මයා | රියදුරු |
| 63. | පී.ඒ.සුනිල් ශාන්ත මයා | කාර්යාල කාර්ය සහායක |
| 64. | ඩබ්. නන්දන මයා | කාර්යාල කාර්ය සහායක |
| 65. | පී.ඩබ්.ඒ. නීල් අසංක මයා | කාර්යාල කාර්ය සහායක |
| 66. | ජී. නිමල් මයා | කාර්යාල කාර්ය සහායක |
| 67. | ඊ. සුසන්ත ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක |
| 68. | ඒ.එන්.සී. ද අල්විස් මයා | කාර්යාල කාර්ය සහායක |
| 69. | කේ.ජී.ධර්මතිලක මයා | කාර්යාල කාර්ය සහායක |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.2 වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය

වගුව - **5.2** වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය - **2016**

| අනු අංකය | වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| 1. | 25 > | 02 | 00 |
| 2. | 26-35 | 11 | 09 |
| 3. | 36-45 | 14 | 13 |
| 4. | 46-50 | 05 | 08 |
| 5. | 51-55 | 02 | 05 |
| 6. | 55 < | 00 | 00 |
| **එකතුව** | | **34** | **35** |

මූලාශ්‍රය **:** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3 ස්ථාන මාරුවීම්

රාජ්‍ය සේවයේ සාමාන්‍ය පරිපාටීන්ට අනුකූලව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 16ක් විය.

**ලේඛනය - 02 2016 වර්ෂයේ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලද දිනය |
|---|---|---|---|
| 1. | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් | 2016.09.30 |
| 2. | එම්. ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | 2016.09.22 |
| 3. | පී. එල්. එම්. චතුරංග මයා | සහකාර අධ්‍යක්ෂ | 2016.12.23 |
| 4. | අයි. කේ. ඒ. පී. කිත්සිරි මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.08 |
| 5. | අයි. එච්. දයන්ත ඉලංකෝන් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.08 |
| 6. | එම්. ඩී. ආර්. රංජනි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.29 |
| 7. | ඒ. අයි. එල්. සිරිසේන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.10.20 |
| 8. | වී.පී.පත්මා ජයතිලක මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.11.02 |
| 9. | ඒ. එම්. එන්. ශ්‍යාමලී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.12.14 |
| 10. | ඩබ්.ටී.ඩී. ද සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.12.31 |
| 11. | ඒ. ඩබ්. එම්. අබේරත්න බණ්ඩා මයා | රියදුරු | 2016.01.25 |
| 12. | බී. එම්. පියරත්න මයා | රියදුරු | 2016.02.16 |
| 13. | ජේ. ජී. සරත් කුමාර මයා | රියදුරු | 2016.04.01 |
| 14. | අජිත් සිසිර කුමාර මයා | රියදුරු | 2016.10.31 |
| 15. | පී. ඒ. තිලකසිරි මයා | කාර්යාල කාර්ය සහායක | 2016.04.25 |
| 16. | ටී. ජී. ආනන්ද මයා | කාර්යාල කාර්ය සහායක | 2016.05.09 |

2016 වර්ෂය තුළ ස්ථාන මාරුවීම් ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව 20 කි. මොවුන් විවිධ රාජ්‍ය ආයතනවල සේවය කර අත්දැකීම් ලද පිරිසක් විය.

**ලේඛනය – 03 2016 වර්ෂය තුළ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 1. | එච්.ජී.සුමනසිංහ මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2016.10.13 |
| 2. | බී.එම්.එස්.බණ්ඩාර මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2016.04.27 |
| 3. | බී.එම්.ඩී.එන්.බාලසූරිය මිය | අධ්‍යක්ෂ | 2016.10.10 |
| 4. | එන්.බී.එන්.පී.ජීවසිරි මිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 2016.05.02 |
| 5. | ඊ.එච්.එන්.ජේ. එදිරිසිංහ මයා | සංවර්ධන නිලධාරී | 2016.02.01 |
| 6. | කේ. ජී. එන්. දිල්මිණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.06 |
| 7. | කේ.ජී.තරංගා ඉරෝෂනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.10.17 |
| 8. | එම්.ඒ.කේ.සී.සමරසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.01.05 |
| 9. | ආර්. ඒ. පී. එල්. රූපසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.01.06 |
| 10. | ඩබ්. ඒ. සුරේෂ් මංගල මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.19 |
| 11. | අයි. එච්. දයන්ත ඉලංකෝන් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.01.04 |
| 12. | වී.පී.පත්මා ජයතිලක මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.05.20 |
| 13. | ඩබ්.ටී.ඩී. ද සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.11.18 |
| 14. | යූ.එල්.ඒ. රිශාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.12.07 |
| 15. | බී.ඒ.පී.ප්‍රේමතිලක මයා | රියදුරු | 2016.02.17 |
| 16. | බී. එම්. පියරත්න මයා | රියදුරු | 2016.01.12 |
| 17. | අයි.පී.ඩබ්.බුද්ධික රත්නසිරි මයා | රියදුරු | 2016.04.07 |
| 18. | ඩබ්.ඩී.අමරසිරි වික්‍රමසිංහ මයා | රියදුරු | 2016.10.03 |
| 19. | පී.ඒ.සුනිල් ශාන්ත මයා | කාර්යාල කාර්ය සහායක | 2016.05.10 |
| 20. | කේ.ජී.ධර්මතිලක මයා | කාර්යාල කාර්ය සහායක | 2016.08.11 |

## 5.4 පුහුණු වැඩසටහන්

### 5.4.1 දේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්ගතව පැවැත්වීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අවශ්‍යතා මෙන්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරයන් ද මෙම වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබිය. ඒ අනුව 2016 වර්ෂය තුළ ලබා දුන් පුහුණුවීම් 5.3 වගුව මගින් දක්වා ඇත.

**වගුව - 5.3 දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම - 2016**

| අනු අංකය | ක්ෂේත්‍රය | පුහුණු ආයතනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (DED) - 2016 | කොළඹ විශ්ව විද්‍යාලය | 01 |
| 2. | රාජ්‍ය කළමනාකරණ පිළිබඳ විද්‍යා උපාධි වැඩසටහන - 2016-2018 (MPM) | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 3. | ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව -2016 | මිලෝදා ආයතනය | 09 |
| 4. | ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - 2016 | මිලෝදා ආයතනය | 06 |
| 5. | දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව -2016 | මිලෝදා ආයතනය | 03 |

### 5.4.2 විදේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ට විදේශීය පුහුණු අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ අත්දැකීම් හා විෂය දැනුම වර්ධනය කිරීමට 2016 වර්ෂය තුළදී ද කටයුතු කරන ලදී. ඒ අනුව නිලධාරීන් දෙදෙනෙකුට විදේශීය පුහුණු අවස්ථාවන් හිමි විය.

**ලේඛනය - 04 විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම - 2016**

| අනු අංකය | නම | තනතුර | ලද පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 1. | එම්. පී. එස්. සල්ගාදු මයා | තොරතුරු තාක්ෂණ සහකාර | අන්තර්ජාල පදනම් නව තාක්ෂණයන් (cloud Computing), සුවිශාල වූ දත්ත ජාල ස්ථාපිත කිරීම සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සලකා ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම පිළිබඳ සමුළුව. | චීනය | 2016.05.24<br>2016.06.14 |
| 2. | ඩබ්. එච්. ජී. ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ | ක්ෂුද්‍ර ආර්ථික විද්‍යා ප්‍රතිපත්තීන් පිළිබඳ විධායක පුහුණු වැඩසටහන - හොංකොං විශ්ව විද්‍යාලය | හොංකොං | 2016.08.01<br>2016.08.05 |

## 5.5 වාර්ෂික තැපැල

මෙම දෙපාර්තමේන්තුවට 2016 වසරේ ලැබුණු ලිපි සංඛ්‍යාව 8,503ක් විය (වගුව - 5.4). මෙම ලිපි විවිධ විෂයයන්ට අදාල වූ අතර තනතුරු ඇති කර ගැනීම, පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ඉල්ලීම්, විවිධ දීමනා සඳහා වූ ඉල්ලීම්, පැහැදිලි කරගැනීම් හා සාමාන්‍ය පරිපාලනය යන විෂයයන් ප්‍රධාන තැනක් ගෙන තිබුණි.

**වගුව - 5.4** **2016 වර්ෂය තුළ ලැබුණු ලිපි සංඛ්‍යාව**

| අනු අංකය | මාසය | ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජනවාරි | 694 |
| 2. | පෙබරවාරි | 800 |
| 3. | මාර්තු | 711 |
| 4. | අප්‍රේල් | 577 |
| 5. | මැයි | 688 |
| 6. | ජූනි | 787 |
| 7. | ජූලි | 688 |
| 8. | අගෝස්තු | 695 |
| 9. | සැප්තැම්බර් | 671 |
| 10. | ඔක්තෝබර් | 725 |
| 11. | නොවැම්බර් | 781 |
| 12. | දෙසැම්බර් | 686 |
| **එකතුව** | | **8,503** |

## 6. මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන යටතේ 2016 වර්ෂය සඳහා මානව සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 242 වැය ශීර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. 53,200,000.00 ක් වූ අතර සත්‍ය වියදම රු.50,459,495.98 ක් විය. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට අනූහතරයි දශම අටයි හතරයක් (94.84%) දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රගතිය පහත 6.1 වගුව මගින් දැක්වේ.

**වගුව - 6.1** **මූල්‍ය ප්‍රගතිය 2015 - 2016**

| වැය විස්තරය | | 2015 | | | 2016 | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ප්‍රතිපාදනය (අවුරා තබන ලද ප්‍රතිපාදන හැර) (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය ( %) | අනුමත ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය (%) |
| **පුනරාවර්තන වියදම්** | | **44,325,000.00** | **43,105,549.01** | **97** | **50,038,000.00** | **48,614,236.39** | **97.15** |
| **පුද්ගල පඩිනඩි** | | **34,075,000.00** | **33,824,612.89** | **99** | **40.152,500.00** | **39,910,025.11** | **99.39** |
| 1001 | වැටුප් හා වේතන | 15,500,000.00 | 15,421,634.77 | 99 | 19,667,500.00 | 19,659,962.76 | 99.96 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 700,000.00 | 556,738.47 | 80 | 960,000.00 | 888,211.28 | 91.88 |
| 1003 | වෙනත් දීමනා | 17,875,000.00 | 17,846,239.65 | 100 | 19,525,000.00 | 19,367,851.07 | 99.19 |
| **ගමන් වියදම්** | | **405,000.00** | **233,920.75** | **58** | **490.000.00** | **176,788.92** | **36.07** |
| 1101 | දේශීය | 200,000.00 | 125,987.50 | 63 | 175,000.00 | 148,488.50 | 84.85 |
| 1102 | විදේශීය | 205,000.00 | 107,933.25 | 53 | 315,500.00 | 28,301.42 | 8.98 |
| **සැපයීම්** | | **3,935,000.00** | **3,582,476.84** | **91** | **3,950,000.00** | **3,737,262.49** | **94.61** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,525,000.00 | 1,447,766.03 | 95 | 1,400,000.00 | 1,345,602.65 | 96.11 |
| 1202 | ඉන්ධන | 2,090,000.00 | 1,906,585.87 | 91 | 2,250,000.00 | 2,095,955.03 | 93.15 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 200,000.00 | 108,955.82 | 54 | 62.000.00 | 60,000.00 | 96.77 |
| 1205 | වෙනත් | 120,000.00 | 119,169.12 | 99 | 238,000.00 | 235,704.81 | 99.03 |
| **නඩත්තු වියදම්** | | **1,900,000.00** | **1,771,757.06** | **93** | **1,540,000.00** | **1,356,603.43** | **88.09** |
| 1301 | වාහන | 1,600,000.00 | 1,552,516.82 | 97 | 1,240,000.00 | 1.220,228.83 | 98.40 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | 219,240.24 | 73 | 300.000.00 | 136,374.60 | 45.45 |
| **සේවා** | | **3,110,000.00** | **2,877,714.31** | **93** | **2,905,000.00** | **2,548,507.21** | **87.72** |
| 1401 | ප්‍රවාහන | 800,000.00 | 720,000.00 | 90 | 675.000.00 | 463,566.95 | 68.67 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,610,000.00 | 1,609,187.41 | 100 | 1,530,000.00 | 1,446,002.49 | 94.50 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1405 | වෙනත් | 700,000.00 | 548,526.90 | 78 | 700,000.00 | 638,937.77 | 91.27 |
| **මාරු කිරීම්** | | **900,000.00** | **815,067.16** | **91** | **1,000,000.00** | **885,049.23%** | **88.5** |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 900,000.00 | 815,067.16 | 91 | 1,000,000.00 | 885,049.23 | 88.5 |
| **මූලධන වියදම්** | | **4,075,000.00** | **3,341,768.73** | **82** | **3,162,000.00** | **1,845,259.59** | **58.35** |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම** | | **900,000.00** | **220,241.00** | **24** | **900,000.00** | **665,509.50** | **73.94** |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000.00 | - | - | 200,000.00 | 665,509.50 | 0 |
| 2003 | වාහන | 700,000.00 | 220,241.00 | 31 | 700,000.00 | - | 96.07 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | **1,225,000.00** | **1,185,549.90** | **97** | **1,350,000.00** | **268,162.63** | **19.86** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,225,000.00 | 1,185,549.90 | 97 | **1,350,000.00** | **268,162.63** | **19.86** |
| **හැකියා වර්ධනය** | | **1,950,000.00** | **1,935,977.83** | **99** | **912,000.00** | **911,587.46** | **99.95** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 1,950,000.00 | 1,935,977.83 | 99 | **912,000.00** | **911,587.46** | **99.95** |
| **මුළු එකතුව** | | **48,400,000.00** | **46,447,317.74** | **96** | **53,200,000.00** | **50,459,495.98** | **94.84** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

**සංවිධාන ව්‍යුහය**

**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**

